**ශීර්ෂය 302, සමූපකාර සේවක කොමිෂන් සභාව**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 302 - සමූපකාර සේවක කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමූපකාර සේවක කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 16 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සමූපකාර සේවක කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම.

2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 2022/05 හි 6 ඡේදයේ ඒසීඒ - (සී) හා 7.6 ඡේදයේ සඳහන් පරිදි මුදල් හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කල යුතු වුවත් අත්තිකාරම් ගෙවීම් සහ අයකර ගැනීමේදී හරස් සටහන් පිළිබඳ අවධානය යොමු කර නොතිබීම නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී රු.272,970 ක් වූ අත්තිකාරම් අයකර ගැනීම් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. | 2022 අප්‍රේල් මස ශ්‍රී ලංකා රේගුව සිට සමුපකාර සේවා කොමිෂන් සභාව වෙත ස්ථාන මාරු වී පැමිණි නිලධාරියෙකුගේ ණය ශේෂය වූ රු.272,970/- හරස් සටහන් මගින් 2022 ජුනි මස නිරවුල් කිරීමට කටයුතු කර ඇත. මෙම අත්තිකාරම් අයකර ගැනීම ශ්‍රී ලංකා රේගුවට අදාළ වන බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය සඳහා හර හා බැර සටහන් ඇතුලත් නොකරන ලදී. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ගිණුම් පිළියෙල කිරීමට වග බලා ගත යුතුයි. |
| (ආ) | අත්තිකාරම් ගෙවීම් රු.837,621 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.564,651 ක් ලෙස රු.272,970 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.272,970 කින් අඩු වී තිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 302-01-01-1203 දරන ආහාර පාන හා නිල ඇඳුම් වැය විෂය සඳහා රු.24,000 ක ප්‍රතිපාදනයක් ඉල්ලුම් කර තිබුණ ද මහා භාණ්ඩාගාරය විසින් අනුමත ඇස්තමේන්තුවේ රු.100,000ක ප්‍රතිපාදන මුදලක් අනුමත කර තිබුණි. | 2022 වර්ෂය සඳහා මෙම වැය විෂයයේ වියදම රු.20,000 ක් පමණි. | සත්‍ය තත්ත්වය මත අදාල නිවැරදි කිරීම් සිදු කර සංශෝධනය කරගත යුතුය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් මස කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැඟිල්ල වෙනුවෙන් රු.225,000 ක කුලියක් 2023 ජනවාරි මස ගෙවා තිබුණ ද එය බැරකම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. අංක 302-01-01-1404 දරන බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු වැය විෂයය යටතේ එම බැරකම පියවීම සඳහා ප්‍රතිපාදන කිසිවක් ඉතිරිව නොතිබුණි. | 302-01-01-1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු වැය විෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල වෙනුවෙන් 2021 දෙසැම්බර් මස සිට 2022 නොවැම්බර් මස දක්වා වන මාස 12 වෙනුවෙන් මසකට රු. 225,000/- බැගින් රු. 2,700,000/- වෙන්කර ගෙන ඇති අතර එම මුළු ප්‍රතිපාදනය ම වර්ෂය තුළ උපයෝජනය කර ඇත. ඒ අනුව 2022 දෙසැම්බර් මස ගොඩනැගිලි කුලිය සඳහා බැරකම්වලට ඇතුලත් වීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවිණි. කෙසේ නමුත් මුදල් පදනම මත ගිණුම් තැබීමට කටයුතු කරන සිදුකරන බැවින් දෙසැම්බර් මස ගොඩනැගිලි කුලී මුදල 2023 ජනවාරි මස ගෙවීම් කිරීමටත් 2023 වර්ෂය සඳහා ගිණුම් තැබීමටත් කටයුතු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට වගබලා ගත යුතුය. |

## 2.3 ගණකාධිකාරී විසින් සිදු කල යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණකාධිකාරී හා ගණකාධිකාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4:1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | මෙම ආයතනය සඳහා එක් ගණකාධිකාරී තනතුරක් පමණක් අනුමත වී ඇති අතර, අභ්‍යන්තර විගණක ලෙස නිලධාරියෙක් පත්කිරීමේ හැකියාවක් නොමැත. | පනත අනුව ක්‍රියාකිරීමට වගබලා ගත යුතුයි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අදාළව නිකුත් කල මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම තුල පහත තොරතුරු ඇතුලත් විය යුතු වුවත් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම තුල පහත සඳහන් තොරතුරු ඇතුලත්ව නොතිබුණි.<br><br>i. අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය,අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර<br>ii. අදාළ වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම,ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ප්‍රතිඵල,වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍ය සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම | මින් ඉදිරියට ක්‍රියාකාරි සැලැස්ම සමඟ එම ලේඛන ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදි. | චක්‍රලේඛය ප්‍රකාරව අදාළ තොරතුරු අන්තර්ගත කළ යුතුයි. |

## 3. 2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------------ | -------------------- |
| (අ) | 2021 කාර්යසාධන වාර්තාවේ 2022 වර්ෂයේ ඉදිරි දැක්ම යටතේ සමූපකාර සේවකයින්ට බලපාන කම්කරු නීතිය හා සමූපකාර නීතිය පිළිබඳව සමූපකාර සේවකයින් දැනුවත් කිරීම සඳහා එක් දින වැඩමුළු 10 ක් පැවැත්වීම සහ එම වැඩමුළු සඳහා සමූපකාර සමිති සේවකයින් 400 ක් පමණ සහභාගි කරවා ගැනීමට අපේක්ෂා කර තිබුණ ද එලෙස ක්‍රියාකර නොතිබුණු අතර පුද්ගලික ලිපිගොනු සකස් කිරීම හා සේවක ආකල්ප වර්ධනය කිරීම සඳහා වැඩමුළු 09 ක් පවත්වා තිබූ අතර ඒ සඳහා සමූපකාර සමිති සේවකයින් 180 ක් පමණක් සහභාගි කරවාගෙන තිබුණි. | ඉන්ධන සඳහා අධික වියදමක් දැරීමට සිදුවීම සහ ඉන්ධන හිඟය හේතුවෙන් ඉන්ධන ලබා ගැනීමට තිබූ අපහසුතා නිසා කොළඹ නගර සීමාව තුල සමූපකාර සමිතිවලට පමණක් වැඩමුළු සංවිධානය කිරීමට සිදුවිය. එබැවින්, සේවකයින් වැඩි පිරිසක් සේවය කරන අධ්‍යාපන සමූපකාර සමිතියේ දිස්ත්‍රික් හෝ පළාත් කාර්යාලවලට වැඩමුළු පැවැත්වීමට අපහසු විය.<br>එසේම, කාර්යාලයේ නිලධාරීන් ද පුහුණු පාඨමාලා අයදුම් කර තිබූ බැවින්, සේවා අවශ්‍යතාව සලකා ඔවුන් වෙත ද ප්‍රතිපාදන ලබා දීමට සිදු වූ අතර, ඒ අනුව වැඩමුළු සහ ඊට සහභාගීවන පිරිස කළමනාකරණය කිරීමට සිදු විය. | සැලසුම් කළ කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයෙන් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනා හා පැමිණිලි සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයක් වන අතර 2022 වර්ෂයේ ලද අභියාචනා 05 ක් තවදුරටත් විසඳීමට පැවතිණි. | 2022 ලැබී විසඳීමට තිබූ අභියාචනා 10 න් අභියාචනා 05 ක් 2023.04.28 වන විට විසඳා ඇත.තවදුරටත් අභියාචනා 05 ක් පමණක් විසඳීමට පවතී. | ප්‍රධාන කාර්යයන් නොපමාව ඉටු කිරීමට කටයුතු කළයුතුයි. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ------------------------- | -------------------- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) සහ 40(2) වගන්ති ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ආයතනය සඳහා එක් ගණකාධිකාරි තනතුරක් පමණක් අනුමත වී ඇති අතර, අභ්‍යන්තර විගණක ලෙස නිලධාරියෙක් පත්කිරීමේ හැකියාවක් නොමැත. | පනත අනුව ක්‍රියාකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුයි. |